# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන)

**2011 අයවැය යෝජනාවලදී ඉදිරිපත් කරන ලද අයවැය යෝජනාවක් ප්‍රකාරව සේවා නියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල පනත සහ විදේශ සේවා නියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල පනත පැනවීම නිසා උද්ගත වූ ඇතැම් ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.**

---

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්
2011 අප්‍රේල් මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2011 මාර්තු මස 28 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[100 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2—PL 005698—1,000 (2011/04)

## විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන)

එල්.ඩී.—ඕ. 26/2011.

**2011 අයවැය යෝජනාවලදී ඉදිරිපත් කරන ලද අයවැය යෝජනාවක් ප්‍රකාරව සේවා නියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල පනත සහ විදේශ සේවා නියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල පනත පැනවීම නිසා උද්ගත වූ ඇතැම් ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද: ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය.

1. මේ පනත 2011 අංක දරන විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

සැක දුරු කිරීම.

2. මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ප්‍රඥප්ති සම්බන්ධයෙන් සහ විශේෂයෙන්ම එම පනත්වල පරිපාලනය, සම්බන්ධයෙන් ක්‍රියාත්මකවන විධිවිධානවලට අදාළව සහ එහි අදාළ වීම, සාමාජිකත්වය, දායක මුදල් සහ දායක මුදල් එකතු කිරීමේ ක්‍රමය සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන පනත්වල විධිවිධාන අදාළ නොවන බවට සලකනු ලැබිය යුතු බව සැක දුරු කිරීමේ කාර්යය සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මඟින් පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

3. (1) විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළ රජයේ ප්‍රතිපත්තියට කරනු ලබන වෙනස් කිරීම් බලාත්මක කිරීම සඳහා මේ පනතේ පළමුවන සහ දෙවන උපලේඛනවලින් යම් උපලේඛනයකට යම් පනතක් එකතු කිරීම හෝ ඒ උපලේඛනයකින් යම් පනතක් අත්හැරීම මඟින් මේ පනතේ පළමුවන උපලේඛනය සහ දෙවන උපලේඛනය පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මඟින් සංශෝධනය කරනු ලැබිය හැකි ය.

(2) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුකූලව පළමුවන උපලේඛනය සහ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම සඳහා අපේක්ෂා කරන ලද යෝජනා සම්මතය පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබීමෙන් පසු උපලේඛනයට කරන ලද සංශෝධනයේ පෙන්නුම් කරන ආකාරයට යෝජනා සම්මතයේ අන්තර්ගත කරුණු සඳහන් කරමින් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ගැසට් පත්‍රයේ නිවේදනයක් පළකරනු ලැබිය යුතු ය.

2—PL 005637- 425 (2011/03)

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

### පළමුවන උපලේඛනය

ප්‍රඥප්තියේ නම

1. 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත

2. 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීමේ පනත

### දෙවන උපලේඛනය

ප්‍රඥප්තියේ නම

1. 2011 අංක  දරන සේවා නියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල පනත

2. 2011 අංක  දරන විදේශ සේවා නියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල පනත

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.